(c) www.sinhalalyrics.com

ප්‍රේමය නම් රාගයෙන් තොර
සඳ එළිය සේ අචින්ත්‍යයි
පාරිශුද්ධයි සුරම්‍යයි

ප්‍රභාවත් වූ වත මඬල ඇත
තවුස් දැහැනක නිශ්චලත්වය
නයණ යුග්මේ රැඳී ඇත්තේ
භාවනාවක කාන්තියයි

දොඩන වදනින් ඇසෙයි නිරතුරු
වනාන්තරයක සකුණ මියැසිය
දෙතොල් අතරින් ගලා එන්නේ
ගීතිකාවක ශාන්තියයි

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - එච්. එම්. ජයවර්ධන